
# ලංකාවිත්ති
LANKA VITHTHI

**LANKA VITHTHI**
**P.O.BOX 14373**
**LONDON NW6 3WU**
**ENGLAND**

*Phone & Fax* : **020 7428 9388**
E-mail : **lanka.viththi @ virgin.net**

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : **Daya Ananda Ranasinghe**

චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal
ජායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam

## කොපියක් ගන්නට බැරි සත්‍යය

**ස**ත්‍යය හෙවත් ඇත්ත ගැන කතා කරන්නට මට හිතුනේ මේ ළඟදි ඇත්ත කියන්න ගිහිං කෙනෙකු සමග අමනාපවෙන්න සිදුවුණු නිසා. ඒක වෙන දෙයක්. ඒක ගැන මම තැවෙන්නෙ නෑ. ඇත්ත නොකිය බෑ. බොහෝදෙනා බොරු වෙන් ජීවත්වෙන්න නොසෑහෙන මහන්සියක් ගන්නා කාලෙක සත්‍යය යයි දෙයක් ලෝකයේ තවම තිබෙන බව දැනීම හිතට සහනයක්. බොරුකාරයො දසදහසක් අතර සත්‍යය තුළ ජීවත්වෙන එක මිනිහෙක් හෝ කොහේ හරි ඉන්න පුලුවන්. ඒකයි වටිනකම.

සත්‍යයෙ, එක එක ප්‍රභේද තියනව කියල සමහරු කියනව. එහෙම වෙන්න බෑ. සත්‍යය කියන්නෙ එකම එක ඒකකයක්. ඒකෙ පිටපත් නෑ. පොතු, කෙඳි, පට්ට ගන්න බෑ. කොයි අතට හැරෙව්වත් එකම විදියයි. හැඩය වෙනස් වෙන්නෙ නෑ. වෙනස් කළොත් ඒක සත්‍යය නොවෙයි. වෙන දෙයක්. සත්‍යය පිරිසිදුයි, පැහැදිලියි, උසාවියෙදි ඇත්ත කියන බවට දිව්රන්නෙත් ඒ කරුණ පදනම් කරගෙන. සත්‍යය හා සත්‍යයම පමණක් ( The truth and nothing but the truth) උසාවියේ දී පවසන බවට එහි නගින අය පෙරොන්දු කරගන්නව පොරොන්දු වෙනව.

සමහරු කියනව ඒක ඇත්ත... ඉතිං ඒ වුනාට මේකත් ඇත්ත නේ... කියල. ඒ කීම මුලුමනින්ම වැරදියි. ඒක සත්‍යය නම්, මේක සත්‍යය වෙන්න බෑ. මේක සත්‍යය නම්, ඒක සත්‍යය වෙන්න බෑ. සත්‍යය මුලින් කිව්ව වගේ එකම එකක්. කිසි විදියකින් සත්‍යය නැත්නම් ඇත්ත දෙකක් ලෝකෙ තියෙන්න බෑ.

සත්‍යය නුනට සත්‍යය වගේ පෙනෙන දේවල් ඕන තරම් මේ ලෝකෙ තියනව. ඒ වගේම බොහොම දෙනෙක් ඒවට රැවටෙනව. කාලයක් ගියාමයි තේරෙන්නෙ රැවටුණ බව. ඒපාර කළකිරෙනව. අපි පිළිගෙන සිටි අය ගැන ඇත්ත කවදා හෝ එළිවුනාම අපි කළකිරෙන්නෙ ඒ නිසයි. ඒ කළකිරීම යට තියෙන්නෙ රැවටීමට වඩා සත්‍යය මුළින් නොදැක්කට තමන් ගැනම එන සියුම් තරහක්. එහෙම තරහ වෙලා බෑ. කරන්න තියෙන්නෙ ආයිත් නොරැවටෙන්න ඒකෙන් පාඩමක් ඉගෙනගැනීම.

සත්‍යය මැණික් ගලකට සමාන කරන්න පුලුවන්. මායාව, බොරුව ආදි මඩෙන් හා පස් වලින් වැහිල, යටවෙලා තිබ්ලා, ගොඩට අරගෙන, සෝදල, කපල, ඔප මට්ටම් කරල ගත්තම දිස්නය දිදී බැබලෙනවා. වටිනවා. අමාරු වුනත් සත්‍යය කෙසේ හෝ මතුකරගත යුතුයි.

සත්‍යය මේ මුලු මහත් විශ්වය පුරා තිබුණත් එම සත්‍යය ගවේශනය කරන්නට, සොයාගන්නට වෑයම් නොකිරීම නිසා මුලු මිනිස් වර්ගයාම අද අතරමංව සිටිනවා. කරන්නේ සත්‍යයට පටහැනි දේවල් නිසාත්, අරමුණ සත්‍යය නොවන නිසාත්, තවත් අවුලට පත් වෙනවා මිස ඒ බොරුවලෙන් ගොඩඒමක් නෑ.

ඒ නිසා සත්‍යය හඳුනා ගන්නට වෑයම් කිරීම ම ජීවිතයේ පරමාර්ථය කර ගන්න. බොරුවට රැවටී මායා ලෝකයේ වසර සීයක් ජීවත්වෙනවාට වඩා සත්‍යය දැක එක දවසක් ජීවත්වීම උතුම්. මේ වෙසක් සමයේ සත්‍යය දකින පිරිසිදු පැහැදිලි ඇස ඔබට ලැබේවා!




**වෙ**සක් යන සිංහල වචනය නිර්මාණය වී ඇත්තෙ වෛශ යන සංස්කෘත වචනයෙන් බිහිවන වෙස් යන්නත්, අග්‍ර යන සංස්කෘත වචනය අග් යනුවෙන් ලිහිල් වී, එය තව දුරටත් ලිහිල්වීමෙන් බිහිවන අක් යන්නත් එක්වී වෙස් + අක් යන සන්ධිය වෙසක් බවට පත්වීමෙන්. එම නිසා වෙසක් මහිමය යන්නෙහි වාච්‍යාර්ථය වන්නේ අග්‍රම වෛශයේ මහිමය නොහොත් මාහැඟි බව යන්නයි.

ශ්‍රීලංකාව වැනි උත්තරාර්ධගෝලීය රටවල ස්වභාව සෞන්දර්යයෙහි අග්‍රම වෛශය මතුවන්නේ මල් හා එලබර වසන්තයෙහි විශිෂ්ටතම ස්වරූපය ජනිතවන වෙසක් මාසයේදියි. එම නිසා ඒ මාසය වෙසක් මහ යනුවෙන් හැඳින්වීම අර්ථාන්විතයි.

මුළු මහත් විශ්වයෙහි සකලවිධ ජීව හා අජීව නිර්මාණයන් අතර අග්‍රම වෛශය වන බුද්ධ වෛශය මෙලොව පහළ වූයේත් ස්වභාව ධර්මයේ අග්‍රම වෛශය පහළ වන වෙසක් මාසයකදීයි. මිනිස් සිරුරක පැන නැගිය හැකි දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණයන්ගෙන් සහ අසීති අනුව්‍යංජනයන්ගෙන් සමන්විත භෞතික කායක් සිදුහත් බිළිඳුන් ලෙස මෙලොව බිහිවූයේත් වෙසක් මාසයකදීය. බුද්ධත්වයෙන් අත්වන අග්‍රම ඵලය වන මහා පරිනිර්වාණය සිදුවූයේත් වෙසක් මාසයකදීයි.

මහා පරිනිර්වාණය යනු ස්වභාව ධර්මයට අනුව වයසත් සමග දිරාපත්වූ බුද්ධ ශරීරයේ ඇතිවන නෛසර්ගික පීඩාවලින් පවා බුද්ධත්වය සඳහටම මිදී ඊට පන්සාලිස් වසකට පෙර බුදු සිත සියළු දුක් පීඩාවලින් මිදුනාසේ සදහටම නිදහස්වීමය. ලොව්තුරා බුද්ධත්වයෙහි ඇතිවෙන මෙම අග්‍රතම මහිමය ලොවට හෙළිවූයේත් වෙසක් මාසයකය.

බුදුන් යනු සාවාභාවිකව ජරා ජීර්ණ වන බුදු කය නොව පරම සැනසිලිදායක අචින්ත්‍ය වූ බුද්ධ චිත්ත ස්වරූපය බවයි. යො ධම්මං පස්සති - සො මං පස්සති යනුවෙන් බුදුසමිඳුන් වක්කලී හිමියන්ට කළ ප්‍රකාශයෙන් හෙළවන්නේ. එම ප්‍රකාශයෙහි සැබෑ අර්ථය ධර්මය දකින්නාට පමණක් බුදුන් දැකිය හැකි බවයි. මෙහි ධර්මය යනු පරම සැනසිලිදායක නිර්වාණ ධර්මයයි.

නිර්වාණ ධර්මය දැකිය හැක්කේ අරහත් ඵලයෙන් එම නිර්වාණ ධර්මය සාක්‍ෂාත් වූ රහතන් වහන්සේ නමකට පමණි. ඒ අනුව නියම බුද්ධ ස්වරූපය දැකගැනීම සඳහා රහත්වී නිවන් දැකීම අවශ්‍ය වේ.

නිවන් දුටු උතුමන් බුදුන් දකින්නේ කර්තෘ, කර්ම, ක්‍රියා යන ත්‍රිභේදයෙන් තොරවයි. බුදුනුත් තමනුත් අවිභේදනීය බෙදිය නොහැකි ලෙස ලෙස ඒකාත්මික වීමෙන් නොහොත් ඒකීය භාවයට පත්වීමෙනුයි. ප්‍රඥාවන්තයන් මෙසේ බුදුන් දුටුවද ඥාණවන්තයන් බුදුන් දකින්නේ කර්තෘ-කර්ම-ක්‍රියා යන තිභේදයෙන් යුක්තවයි. විකඳ්කඳාණවන්තයින් බුදුන් දකින්නේ සහවාතාවෙන් බුද්ධ ස්වරූපයට පත්වීමෙනි. නිර්වාණාවබෝධයෙන් බුදුන් හා අනන්‍යතාවට පත්වීමෙනි.

බුදු පසේ බුදු මහරහතන් වහන්සේලා භේදයකින් තොරව අත්දකින්නේ එකම නිවනේ එකම ස්වරූපයයි. ලෞකික මට්ටම් අනුව වෙනස් වන විවිධ මට්ටම් ලෝකෝත්තර නිවනේ නැත. මෙලොව ජීවිතයේදී බුදුවරුන් අතර මෙන්ම ශ්‍රාවකයින් අතරත් කායික හා මානසික වෙනස්කම් තිබුණද නිවනේදී ඒ සියල්ලලන්ටම ඇත්තේ එක හා සමාන ස්වරූපයකි. විශිෂ්ටත්වය එයයි.

මෙලොවදීම අත්දැකිය හැකි බුද්ධ ස්වරූපය නොහොත් බුද්ධ වෛශය අප තුළ සහජයෙන්ම නිධන්ගතව ඇත. ඒ අග්‍රතම වෛශය කෙදිනක හෝ අප තුළින් අවදිවන්නේ රහත්වූ දිනකය. ඒ අග්‍ර වෛශය පළමුවරට මෙලොව පහළවීම නිමිතිකරගෙන වෙසක් උළෙල සමරන අයගෙන් සිදුවිය යුතු වැදගත්ම කාර්‍යය වන්නේ එම උත්තම ස්වරූපය තමන් තුළද සැඟව ඇති බව තේරුම් ගෙන, එම ස්වරූපය තමා තුළින් අවදිවීමට අවශ්‍ය වත්පිළිවෙත්හි යෙදීමයි. ඒ සියළුම වත්පිළිවෙත් වලට පදනම වන්නේ සියල්ලට හා සියල්ලන්ටම හිතසුව කැමති මෛත්‍රියයි.

මෛත්‍රියෙන් තොරව නියම දන්දීමක්වත්, සිල් රැකීමක්වත්, භාවනා කිරීමක්වත්, නිවන් දැකීමක්වත් සිදුනොවේ. එහෙත් මෛත්‍රිය යනු කරන දෙයක් නොව නොකරන දෙයකි. ලෝභ, ද්වේෂ සහ මෝහ යන අකුශල මූලයන් පදනම්කරගෙන අප තුළ පොදිබැඳ ගත්තාවූ ඊර්ෂ්‍යා, ක්‍රෝධ, වෛරාදී ක්ලේශ ධර්මයන් ක්‍රියාත්මක නොවන විට අප තුළ රැඳෙන්නේ අලෝභ, අද්වේශ, අමෝහ මූලිකවූ මෛත්‍රී ධර්මයයි. ලෝභ, ද්වේශ, මෝහ පාදක ඊෂ්‍යා, ක්‍රෝධ, වෛරාදිය නොකර සිටීමයි. මිනිස් සිතක පහළ විය හැකි අග්‍ර වෛශය නමැති වෙසක් යනු මෙයයි.

♦ *සම්මානිත මහාචාර්‍ය ටී. එස්. අබේවික්‍රම* **Harrow UK**

## Dhammapada

**Your own self is your master; who else could be? With yourself well controlled, you gain a master very hard to find, and the Nibbana too.**

## ධම්මපදය

තමාට පිහිට තමාමය. වෙන කවරෙකු පිහිට වේද? තමා මනාව හික්මුණු කල්හි සොයාගන්නට ඉතා අපහසු ගුරුවරයෙකු තමා තුළින්ම ලැබේ. දුර්ලභ වූ නිවනද ලැබේ.

## ✳ නව සහශ්‍රයට ධර්මානුශාසනා ✳

### හිතොපදේශයෙන්

වර්ධනාං වාටසන්මාන: - බලානාං ප්‍රීතයෙ කුත:
ඵලන්ත්‍යමෘත සෙකෙපි - නපථ්‍යානි විෂද්‍රුමා

***අර්ථය** : වැඩීම, බුහුමන් කිරීම දුර්ජනයන්ගේ සතුට පිණිස කොයින්ද? අමා දිය ඉස්සත් විෂ ගස් හි හිතකර ගෙඩි හට නොගනිත්.*

**දු**දනන්ගේ ස්වභාවය කෙසේද යන්නට තවත් නිදසුනක් ලෙස මෙම පද්‍යය උපයෝගී කරගෙන ඇත. දුදනා යන්නෙහි දු යන්නෙන් දු යන තවත් තේරුමක් වෙයි. එනම් නින්දිත යන්නයි. ඒ අනුව දුදනා යනු නින්දිත, නරක, නපුරු පුද්ගලයායි.

මෙම පද්‍යයෙහි සඳහන් ආකාරයට වැඩීම හා බුහුමන් කිරීම වුවද දුදනාගේ සතුට පිණිස නොපවතී. වැඩීම යනු පෝෂණය කිරීම හෙවත් හදාවඩා ගැනීමයි. නැතහොත් ඇතිදැඩි කිරීමයි. දෙමාපියන් විසින් කරුණාව, දයාව, මෛත්‍රිය මුසුවූ දරු සෙනෙහසින් දරුවන් ඇතිදැඩි කිරීම අතිශයෝක්තියක් නොවේ. එය සියයට අනූනවයකටත් වැඩි දෙමාපියන්ගේ මිළකළ නොහැකි අගයකි.

දෙමාපියන්ට අමතරව සමහර විට සහෝදර සහෝදරයන්ගේ සොයුරුපෙමින් යුතුව හැදෙන වැඩෙන අය හා ඥාතීන් යටතේත්, දරුවන් මෙන් පිටස්තර අය විසිනුත් ඇතිදැඩි කරනු ලබන දරුවන් ගැනද අපි දනිමු. එලෙස අසීමිත සෙනෙහසින් හදා වැඩුවද ඇතැම් අය දුදනන් ලෙස තමා පෝෂණය කළ අය කෙරෙහි හැසිරීම ශෝචනීයයි.

සුළු වරදකින් හෝ අතපසුවීමකින් හෝ ඇතැම් විට කිසිදු හේතුවකින් තොරව කිපෙන දුදනන් සතුරන් සේ තමන්ට උපකාර කළ අය කෙරෙහි උරණව ඔවුන්ට එරෙහි වෙති. කෙළෙහි ගුණ නොතකන අකෘතඥයින්ගේ සිරිත එයයි. ඔවුන් කිසි ලෙසකින්වත් සතුටු කළ නොහැකියි.

බුහුමන් කිරීමෙන් වත් දුර්ජනයින් සතුටු කළ නොහැකි බව මෙහි දෙවන කරුණයි. යම් කෙනෙකුගේ වැඩිහිටි බව, උසස් නිලතල සමාජ තරාතිරම් අනුව අනෙක් අය විසින් ලබාදෙන ගෞරව පුදසත්කාර යනාදී බුහුමන් වේ. සමාජයෙන් කොතරම් ගරුබුහුමන් ලැබුවත් දුදනන්ගේ ස්වභාවය කිසිවිටෙකත් ඉන් සෑහීමකට පත් නොවීමයි. මේ සඳහා නිදර්ශනඅප සමාජයේ එමටය.

ඉහතකී පද්‍යයට අනුව විෂ ඵල ලබාදෙන ගස්වලට අමෘතය හා සමාන ජලය වත් කළද කිසිවිටෙකත් එම ගස්වලින් මිහිරිඵල ලබානොදෙන බව කියැවේ එය දුදනන්ගේ චරිත ලක්‍ෂණ වලට උපමාකර ඇත.

මේ සඳහා අපේ පැරණි කවියක් ද කදිම ගැලපීමකි.

කොපමණ ගුණ කළ ත්
දුදනෝ නොවෙති යහප ත්
කිරි දියෙනි දෙවිය ත්
අඟුරු සුදුවන කලෙක් නම් නැත්

මෙහි අදහස මෙයයි. අඟුරු කොපමණ කාලයක් කිරිවලින් සේදුවත් එම අඟුරුවල කළු පැහැය කිසිදා නැති නොවන්නාක් මෙන් කොතරම් හොඳින් සැලකුවත් නපුරු අදහස් ඇති දුර්ජනයන් කිසි කලෙක යහපත් නොවන්නේය.

මෙය වෙනස් නොවන සිද්ධාන්තයකි.



♦ ***පූජ්‍ය විල්ඔය විමලජෝති හිමි***
**ලන්ඩන් බෞද්ධ විහාරය**
**London Buddhist Viharaya**
**The Avenue, London W4**


**ANOOMA & HEGODA**
**Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 0 2 0 8 3 4 8 7 7 7 2**

**Work Permits and Highly Skilled Migrant Applications done.**
**We also deal with visa refusal from British High Commission in Colombo**

Colombo Office
**Hegoda & Hegoda**
**100/6 Rosemead Place, Colombo 7**
**Tel. 2672432 / 0777686632**